
**<u>වාර්ෂික ස්ථාන මාරු - 2024</u>**

**<u>අභියාචනා ඉදිරිපත් කිරීමේ උපදෙස් මාලාව</u>**

**(A) <u>අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන් විසින් සිය වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත් මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස් :</u>**

01. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන් විසින් සිය අභියාචනා අයදුම්පත්‍රය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ (online) පමණක් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

02. දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියේ (www.cs.sp.gov.lk) මුල් පිටුවේ ඇති **<u>"වාර්ෂික ස්ථාන මාරු පද්ධතිය"</u>** වෙත පිවිස හෝ http://www.cs.sp.gov.lk/trans_2024 වෙත පිවිස වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට හැකියාව පවතී. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිතා කිරීම වඩාත් සුදුසු වේ. ජංගම දුරකථන භාවිතා කරමින් අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබට යම් අපහසුතාවයන් / තාක්ෂණික දෝෂ ඇතිවිය හැකිය.)





03. **කිසිදු නිලධාරියෙකු වෙනත් නිලධාරියෙකුගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත එම <u>නිලධාරියාගේ අනුදැනුමකින් තොරව</u>** මාර්ගගත වාර්ෂික ස්ථාන මාරු අභියාචනා තොරතුරු පද්ධතියට ඇතුළත් නොකළ යුතු ය. එසේ අදාළ නිලධාරියාගේ අනුදැනුමකින් තොරව අයදුම්පත් යොමු කිරීමක් සිදු කර ඇති බවට තොරතුරු අනාවරණය වුවහොත් එකී පුද්ගලයින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විනයානුකූල ව පියවර ගනු ලැබේ.

04. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත්‍ර මාර්ගගතව (online) යොමු කිරීම සඳහා දත්ත ඇතුළත් කිරීමට යම් ආකාරයක අපහසුතාවයක් පවතී නම් එම නිලධාරීන් විසින් <u>පෞද්ගලික ලිපිගොනු විෂය භාර නිලධාරියාගේ / ස්ථාන මාරු විෂය භාර නිලධාරියාගේ සහාය ලබා ගනිමින් නිවැරදි දත්ත ඇතුළත් කිරීම සඳහා</u> හැකි උපරිමයෙන් කටයුතු කළ යුතු ය.

05. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත සඳහා තොරතුරු ඇතුළත් කිරීමේදී ඔබ හට තාක්ෂණික හෝ වෙනත් සහායක් අවශ්‍ය වන්නේ නම් **<u>091-4944010, 091-4946365, 071-0706425 (WhatsApp)</u>** දරණ දුරකථන මාර්ග ඔස්සේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු විෂය (සුරංග මයා / වයෝමි මිය) සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන්න.

## 06.01 දත්ත පද්ධතියට ඇතුළත් වීම (Login to the System)

- ඉහත දක්වා ඇති ආකාරයට වාර්ෂික ස්ථාන මාරු දත්ත පද්ධතියට පිවිසීමේ දී පහත තිරයේ දක්වා ඇති ආකාරයට LOGIN මත Click කර අදාළ තොරතුරු ලබා දී ඔබගේ ගිණුමට පිවිසෙන්න.





| සම්පූර්ණ කළ යුතු තොරතුරු | උපදෙස් |
|---|---|
| **ජාතික හැඳුනුම්පත් අංකය** | නිලධාරියා විසින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් යොමු කිරීමේ දී භාවිතා කළ ජාතික හැඳුනුම්පත් අංකය ලබා දෙන්න. (ස්ථාන මාරු ලැයිස්තුවේ ඇති ජාතික හැඳුනුම්පත් අංකයම ලබා දීමට කටයුතු කරන්න.) |
| **Password** | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් යොමු කිරීමේදී ලබා දුන් රහස් මුර පදය ලබා දෙන්න. |

- ඔබගේ මුරපදය අමතක වූයේ නම් <u>**Forget Your Password Click Here**</u> මත Click කර, ඔබ විසින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ලබා දෙන ලද ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය ලබා දුන් විට ඔබගේ මුරපදය කෙටි පණිවිඩයක් (SMS) මගින් එකී ජංගම දුරකථන අංකය වෙත යොමු කරනු ලැබේ. ඔබට යම් සහායක් අවශ්‍ය වන්නේ නම් **<u>091-4944010, 091-4946365, 071-0706425 (WhatsApp)</u>** දරණ දුරකථන මාර්ග ඔස්සේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු විෂය (සුරංග මයා / වයෝමි මිය) සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන්න.

## 06.02 අභියාචනා අයදුම්පත් ඉදිරිපත් කිරීම (submit the appeal)


- දත්ත පද්ධතියට පිවිසි විට ඔබ විසින් ඉදිරිපත් කළ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය දර්ශනය වන අතර එහි දකුණු පස ඉහළ කෙලවරේ ඇති "APPEAL HERE" මත click කිරීම මඟින් අභියාචනා අයදුම්පත්‍රය දර්ශනය වේ.




- එවිට ඔබ වෙත ලැබී ඇති අභියාචනා අයදුම් පත්‍රයේ මේ වන විටත් අපගේ මාර්ගගත ස්ථාන මාරු දත්ත පද්ධතියේ ඇතුළත් තොරතුරු දර්ශනය වන අතර ඊට අමතරව ඔබ විසින් එහි පහත තොරතුරු සම්පූර්ණ කළ යුතුය.

| සම්පූර්ණ කළ යුතු තොරතුරු | සම්පූර්ණ කිරීමට උපදෙස් |
|---|---|
| 11. අභියාචනා මඟින් ඉල්ලුම් කරන වෙනත් සේවා ස්ථාන | මෙම තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වන අතර මේ යටතේ ඔබ විසින් අභියාචනා කරන වෙනත් සේවා ස්ථාන 03ක් ඇතුළත් කළ යුතුය. තව ද, ඔබගේ සේවාවට අදාළ තනතුරු ඇතුළත් සේවා ස්ථාන පමණක් මෙහි දර්ශනය වේ. |
| 12. අභියාචනා ඉදිරිපත් කිරීමට හේතුව කෙටියෙන් සඳහන් කරන්න | මෙහිදී ඔබ විසින් අභියාචනය ඉදිරිපත් කිරීමට පාදක වන්නාවූ හේතු / අවශ්‍යතාවය කෙටියෙන් සඳහන් කළ යුතුය. තවදුරටත් කරුණු වාර්තා කළ යුතු නම් එය ඇමුණුම් ආකාරයෙන් ඇතුළත් කළ හැකි අතර ඊට අවශ්‍ය උපදෙස් මෙහි ඉදිරි පිටුවල ඇතුළත් කර ඇත. |
| 13. වෙනත් කරුණු | මෙම අයදුම්පතෙහි ස්වයංක්‍රීය ව පැමිණි යම් තොරතුරක් නිවැරදි නොවේ නම් හෝ දෝෂ සහිත නම් ඒ පිළිබඳ ව කෙටියෙන් මෙහි සඳහන් කරන්න. |

- අයදුම්පත අවසානයේ පවතින පහත ප්‍රකාශය ඉදිරියේ ✓ ලකුණ යොදන්න.




- ඉන් අනතුරුව අභියාචනා දත්ත ඇතුළත් කරන්න යන්න button දර්ශනය වන අතර ඒ මත Click කිරීම මඟින් ඔබගේ අභියාචනා අයදුම් පත්‍රය දත්ත පද්ධතියට ඇතුළත් කළ හැක.

- ඒ අනුව, ඔබගේ අභියාචනය සාර්ථක ලෙස දත්ත පද්ධතියට ඇතුළත් වූ පසු ඒ බැව් ඔබගේ ස්ථාන මාරු අභියාචනා අයදුම්පත් අංකය ද සමගින් SP_TRANSFER කෙටි පණිවුඩ සේවාව (SMS) මගින් ඔබගේ ජංගම දුරකථනය වෙත පහත පරිදි කෙටි පණිවුඩයක් මගින් දැනුම් දෙනු ලැබේ.

> Obage Abhiyachanawa sarthakawa sampoorna karana ladi, Abhiyachana ankaya - 10

- ඉන් අනතුරුව ඔබට සම්පූර්ණ කරන ලද අභියාචනා අයදුම්පත්‍රය දර්ශනය වන අතර අයදුම්පත්‍රයෙහි පහළින් ලැබෙන සබැඳිය (Choose File) මගින් ඉහත අභියාචනය සමඟ ඉදිරිපත් කළ යුතු යම් ලේඛනයක් (pdf කරන ලද) ඇතුළත් කළ හැකිය. Choose File මත Click කර ඔබට අවශ්‍ය ලේඛනය තෝරා අනතුරුව submit කිරීම මගින් එම ලේඛනය දත්ත පද්ධතියට යොමු වන අතර මෙහිදී එක් ගොනුවක් පමණක් ඇතුළත් කිරීමට හැකියාව පවතින බැවින්, අවශ්‍ය සියලු ලේඛන එක ගොනුවක් සේ සකස් කර Upload කිරීමට කටයුතු කරන්න.




- අභියාචනා අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට ඇතුළත් කළ පසුව නැවතත් කිසි විටක සංශෝධනය කළ නොහැක. එබැවින් සියලු තොරතුරු නැවත වරක් පරීක්ෂා කිරීමෙන් අනතුරු ව අයදුම්පත පද්ධතිය වෙත ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

- යම් හෙයකින් ඔබ විසින් අදාළ අයදුම්පතේ තොරතුරු නිසි පරිදි සම්පූර්ණ කර නොමැති නම් "දත්ත ඇතුළත් කරන්න" මත Click කළ ද, අයදුම්පත පද්ධතියට ඇතුළත් කිරීමට අවස්ථාව නොදෙන අතර තවදුරටත් සම්පූර්ණ කළ යුතු තොරතුරු ඔබට පෙන්වනු ලැබේ.

- **2024 ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ මගින් ස්ථාන මාරු නියෝග නොලද, එහෙත් තව දුරටත් ස්ථාන මාරු ලැබීමට අපේක්ෂා කරන නිලධාරීන් සඳහා ද ඉහත පරිදි ම අභියාචනාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඇත.**

- **මෙලෙස අභියාචනා අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමය ඔසසේ ඉදිරිපත් කිරීමට ඇති අවස්ථාව 2024.05.02 දින රාත්‍රී 12.00 න් අවසන් වේ.**

**(B) <u>වාර්ෂික ස්ථාන මාරු අයදුම් නොකළද ස්ථාන මාරු ලද "2B අක්ෂරය සහිත ස්ථාන මාරු අයදුම්පත් අංක හිමි නිලධාරීන්" විසින් සිය වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත් මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස් :</u>**

1. 2024 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය යටතේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් කළ යුතු වුවද, එලෙස අයදුම්පත් ඉදිරිපත් නොකළ බවට අදාළ ආයතන ප්‍රධානීන් විසින් දැනුම් දී ඇති නිලධාරීන් සඳහා 2B අක්ෂරය සහිත ස්ථාන මාරු අයදුම්පත් අංක හිමි වන අතර, එම නිලධාරීන් හට වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබී ඇති විටක ඔවුන් විසින් පහත පරිදි සිය අභියාචනා අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

2. 2024 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය මඟින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්කරුවන් සඳහා සිය අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමාවේදය සඳහන් කර ඇති උපදෙස් මාලාවේ අංක 07 කොටසෙහි ඇතුළත් ක්‍රමවේදය ප්‍රකාරව, (http://www.cs.sp.gov.lk/tansfer_2024/2023_12_19.pdf) 2B අක්ෂරය සහිත ස්ථාන මාරු අයදුම්පත් අංක හිමි නිලධාරීන් විසින් නව ගිණුමක් සකස් කිරීම සඳහා ලියාපදිංචි වීමෙන් (REGISTER) අනතුරුව සිය අභියාචනා අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. ඒ සඳහා ඔබගේ කාර්යාලයේ පෞද්ගලික ලිපිගොනු විෂය නිලධාරී / ස්ථානමාරු විෂය නිලධාරීගේ සහයෝගය ලබා ගන්න.


3. එලෙස ගිණුමක් සකස් කිරීමෙන් අනතුරුව ඉහත A කොටසේ දක්වා ඇති ආකාරයටම ඔබගේ අභියාචනා අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ.

4. ඔබට යම් සහායක් අවශ්‍ය වන්නේ නම් **<u>091-4944010, 091-4946365, 071-0706425 (WhatsApp)</u>** දරණ දුරකථන මාර්ග ඔස්සේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු විෂය (සුරංග මයා / වයෝමි මිය) සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන්න.

## (C) <u>අභියාචනා අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online) නිර්දේශ කිරීමට ආයතන ප්‍රධානීන් සඳහා උපදෙස්:</u>


1. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අභියාචනා අයදුම්පත්‍රය ආසන්නතම ආයතන ප්‍රධානියා මඟින් සෘජුවම ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ (online) යොමු කිරීමට කටයුතු සකස් කර ඇත.

2. දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියේ (www.cs.sp.gov.lk) මුල් පිටුවේ ඇති **"වාර්ෂික ස්ථාන මාරු පද්ධතිය"** වෙත පිවිස හෝ http://www.cs.sp.gov.lk/trans_2024 වෙත පිවිස වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත් සඳහා සිය නිර්දේශ ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධානීන්ට හැකියාව පවතී. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිතා කිරීම වඩාත් සුදුසු වේ. ජංගම දුරකථන භාවිතා කරමින් අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබට යම් අපහසුතාවයන් / තාක්ෂණික දෝෂ ඇතිවිය හැකිය.)



## 03. දත්ත පද්ධතියට ඇතුළත් වීම (Login)

- ඉහත ලබාදී ඇති උපදෙස් පරිදි වාර්ෂික ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් වීම සඳහා පහත තිරයේ දක්වා ඇති තොරතුරු සම්පූර්ණ කරන්න.





| **සම්පූර්ණ කළ යුතු තොරතුරු** | **උපදෙස්** |
|---|---|
| **ජාතික හැඳුනුම්පත් අංකය** | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කිරීම සඳහා ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් වීමට ඔබ භාවිතා කළ ජාතික හැඳුනුම්පත් අංකය ලබා දෙන්න. |
| **Password** | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කිරීම සඳහා ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් වීමට ඔබ භාවිතා කළ රහස් මුර පදය ලබා දෙන්න. |

- ඔබගේ මුරපදය අමතක වූයේ නම් **Forget Your Password Click Here** මත Click කර, ඔබ විසින් පෙර ලියාපදිංචියේදී ලබා දෙන ලද ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය ලබා දුන් විට ඔබගේ මුරපදය කෙටිපණිවිඩයක් (SMS) මගින් එකී ජංගම දුරකථන අංකය වෙත යොමු කරනු ලැබේ.

## 07.04 අභියාචනා අයදුම්පත්‍ර නිර්දේශ කිරීම. (Recommendation of the Appeals)

- දත්ත පද්ධතියට ඇතුළත් වීමෙන් අනතුරුව පහත තිරය දිස්වන අතර එහි මේ වන විට ඔබ වෙත ලැබී ඇති අභියාචනා අයදුම්පත් දර්ශනය වේ.



- ඒ අනුව, ඔබ විසින් මේ වන තෙක් නිර්දේශ නොකළ අභියාචනා අයදුම්පත් තැඹිලි පැහැයෙන් දිස්වන අතර ඔබ විසින් නිර්දේශ ඉදිරිපත් කර අවසන් කළ අභියාචනා අයදුම්පත් කොළ පැහැයෙන් දිස්වේ.

- "අභියාචනා අයදුම්පත් පරීක්ෂා කරන්න" යන්න මත Click කර ඔබට අදාළ නිලධාරීන්ගේ අයදුම්පත පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔබගේ නිර්දේශය ඇතුළත් කළ යුතු අතර, ඉන් අනතුරුව "නිර්දේශ කරන්න" මත Click කිරීම මඟින් අදාළ අභියාචනා අයදුම්පත සෘජුවම ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු වේ.

- ඔබට යම් සහයක් අවශ්‍ය වන්නේ නම් 091-4944010, 091-4946365, 071-0706425 (සුරංග මයා) දරණ දුරකථන මාර්ග ඔස්සේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු විෂය සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන්න.

- <u>වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත් සඳහා ඔබගේ නිර්දේශ ලබා දීම 2024.05.03 දින ප.ව.05.00 ට අවසන් වන අතර ඊට පූර්ම ව සියලු අභියාචනා අයදුම්පත් සඳහා ඔබගේ නිර්දේශ ලබා දීමට කටයුතු කළ යුතුය.</u>